# පුංචි මැජික් කාරි



සනුලි රෙහන්සා අබේසිංහ

ප්‍රථම මුද්‍රණය - 2023

කතාව සහ චිත්‍ර - සනුලි රෙහන්සා අබේසිංහ

කතෘගේ ලිපිනය - අංක: 115/2,
හේවාහැට පාර,
තල්වත්ත, මහනුවර.

පරිගණක අක්ෂර හා පිටු සැකසුම :චම්පා ස්ටෝර්ස්
අංක: 51,
කොටුගොඩැල්ල වීදිය,
මහනුවර.

# පිදුම

මෙම කතන්දර පොත
ලිවීමට මා හට මග පෙන්වූ
රේණුකා රාජපක්ෂ ගුරුතුමියට
ආදරයෙන් පිළිගන්වමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයේ ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවයන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැලපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂි ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවන්ට ගැළපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක් වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමණාකරන මණ්ඩලය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන්, සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම් ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය-මහනුවර.

2023.10.20

එකමත් එක ගමක හිටියා ලිලී කියලා පුංචි ගැහැණු ළමයෙක්. එයාගේ පවුලේ අම්මයි, තාත්තයි හිටියා. ඒ අය සතුටින් ජීවත් වුණා.



ඔන්න එක දවසක ලිලී චිත්‍රපටයක් බලමින් හිටියා. ඒ කතාවේ මැජික්කාරියෙක් හිටියා.



ඒ මැජික්කාරිට අරුම පුදුම මායා බලයක් තිබුණා. ඒක බලපු ලිලීට මැජික්කාරියෙක් වෙන්න ආසා හිතුණා.



එයා අම්මාගෙන් මෙහෙම ඇහුවා “අම්මේ මට ආසයි මැජික්කාරියෙක් වෙන්න.”



“පුතේ අපිට මැජික්කාරියක් වෙන්න බැහැ.” අම්ම කිවුවා. ලිලීට ඒකට දුක හිතුණා.



එයා මිදුලට ගියා. දුකින් කල්පනා කරමින් හිටියා. දන්නෙම නැතිව හවස් වුණා.



ලිලීගේ අම්මා ලිලීට රෑ කෑම කන්න කතා කළා. එයා කෑම කාලා නින්දට ගියා.




එයාට මැජික්කාරිය ගැනම හිතමින් ඉද්දි එයාට නින්ද ගියා.



එයාට හීනයක් පෙනුණා. එයා හීනෙන් දැක්කා එයා මේ ලෝකේ දක්ෂම මැජික්කාරිය වෙලා අසරණ අයට උදවු කරනවා.



ලිලී එක පාරටම ඇහැරුණා. එයා අම්මාට එයා දැකපු හීනේ කිවුවා. අම්මාට හිනා ගියා. ලිලීටත් හිනා ගියා.



"ඔයා හීනෙන් හරි මැජික්කාරියෙක් වෙලා හොඳ වැඩ කලානේ." අම්මා කිවුවා ලිලීටත් හරිම සතුටුයි.



# ස්තූතිය

මෙම පොත සෑදීමට මා හට

උදවු කල මාගේ දෙමාපියන් ගුරුවරුන්

ඇතුළු සියළුදෙනාටම

ස්තූතිය පුද කරමි.

සනුලි රෙහන්සා අබේසිංහ
**2 ශ්‍රේණිය C**
මහාමායා බාලිකා විද්‍යාලය,
මහනුවර

## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතු කොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව **2014** වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලගාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය භික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වුයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

“දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට,
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට
යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ
**2023.10.20**

ISBN 978-624-206-881-7
9 786242 068817